සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
**- 2018**
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 1 |

**සැලකිය යුතුයි.**

i සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
**iii ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
iv එම පිළිතුරු පත්‍රයේ පිටු පස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. බුදුරජාණන් වහන්සේ විසින් අගසව් දෙදෙනා වහන්සේ ලෙස නම් කොට වදාළේ,

1. සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා ය.
2. ආනන්ද නන්ද මහරහතන් වහන්සේලා ය.
3. අනුරුද්ධ රාහුල මහරහතන් වහන්සේලා ය.
4. කොණ්ඩඤ්ඤ වප්ප මහරහතන් වහන්සේලා ය.

02. " මෙවන් පුතකු ලද මවක් පියෙක් මෙන් ම මෙවන් ස්වාමියෙකු ලද බිරිඳක් ද නිවුනෝ වෙති." යන අදහස ප්‍රකාශ කරන ලද්දේ,

1. සුජාතා සිටුකුමරිය විසිනි.
2. භද්දකච්චායනා කුමරිය විසිනි.
3. කිසාගෝතමී කුමරිය විසිනි.
4. ඛේමා කුමරිය විසිනි.

03. "චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස" යනු,

1. සිව් බඹ විහරණයි.
2. සිව් සඟරා වතයි.
3. සිව් පසයයි.
4. සිව්රඟ සෙනඟයි.

04. යම් නුවණැති අයකු සියලු කෙලෙස් නසා උතුම් අරහත් තත්වයකට පත් වන විට සිදු වන්නේ ,

1. මිනිස් තත්ත්වය ඉක්මවා දේවත්වයට පත්වීමයි.
2. දේව තත්ත්වය ඉක්මවා බ්‍රහ්ම තත්වයට පත්වීමයි.
3. පෘථග්ජන තත්ත්වය ඉක්මවා ලෝකෝත්තර තත්වයට පත්වීමයි.
4. මරණය ඉක්මවා උපදින තත්ත්වයට පත්වීමයි.

05. බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලාට වේරංජා නුවර දී මහත් අභියෝගයකට මුහුණ දීමට සිදු වූයේ ,

1. බිම්බිසාර රජුගේ ආරාධනාවක් පිළිගැනීමෙනි.
2. අනේපිඬු සිටුතුමාගේ ආරාධනාවක් පිළිගැනීමෙනි.
3. සංජය පිරිවැජියාගේ ආරාධනාවක් පිළිගැනීමෙනි.
4. උදය බමුණාගේ ආරාධනාවක් පිළිගැනීමෙනි.

06. " අනේක ජාති සංසාරං....... " යනා දී ගාථාවෙන් දැක්වෙන්නේ ,

1. උපතේ දී සිදු කළ සිංහ නාදයයි.
2. බුදු වීමේ දී පළ කළ ප්‍රීති වාක්‍යයි.
3. ධර්ම දූත පිරිසට කළ අවවාදයයි.
4. අවසාන බුද්ධ වචනයයි.

07. අමු සොහොනක මළ මිණියකට ගැට ගසා සිටිය දී බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද්දේ,

1. සුනීත ය.
2. සෝපාක ය.
3. ඡන්න ය.
4. අජාසත්ත ය.

08. " අක්කෝධේන ජිනේකෝධං ......... " යනා දී ගාථාව අනුව ක්‍රෝධ කරන්නා ජය ගත හැක්කේ,

1. මෛත්‍රියෙනි
2. කරුණාවෙනි.
3. අනුකම්පාවෙනි.
4. වාදකිරීමෙනි.

09. බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය ප්‍රකට වන අවස්ථාවක් වූයේ,

1. අදින්නපුබ්බක පිළිබඳ සිදුවීමයි.
2. ඛේමා කුමරිය පිළිබඳ සිදුවීමයි.
3. විශාඛා පිළිබඳ සිදුවීමයි.
4. අංගුලිමාල පිළිබඳ සිදුවීමයි.

10. බෝසත්වරු ඛන්ති උප පාරමිතාව පුහුණු කිරීමේ දී,

1. බාහිර වස්තු කැප කරති.
2. තම ශරීර අවයව පවා කැපකරති.
3. තමන්ගේ මුළු ජීවිතයම කැප කරති.
4. තම දූදරුවන් පවා කැප කරති.

11. තමන්ගේ බාහිර වස්තු කැප කරමින් දානා දී පාරමිතා ගුණ ධර්ම සම්පූර්ණ කරන උතුමකුට ලද හැකි ඉහළම ප්‍රතිඵලය වන්නේ ,

1. සම්මා සම්බුද්ධත්වයයි.
2. පසේ බුද්ධත්වයයි.
3. අරහත් භාවයයි.
4. ධ්‍යාන ලාභී බවයි.

12. "දූරංගමං ඒක චරං ........ " යනා දී ගාථාව අනුව සිතෙහි ලක්ෂණ අතුරින් දෙකක් වන්නේ,

1. තනිව හැසිරීම හා දුර ගමන් කරන බවයි.
2. තැන තැන ඇලෙන බව හා ගැටෙන බවයි.
3. නිශ්චල බව හා චංචල බවයි.
4. දුර වසන බව හා ළඟ වසන බවයි.

13. දක්ෂ, නිවැරදි, නිරෝගී යන අර්ථ ඇති වචනය වන්නේ,

1. "කුසල" යන්නයි.
2. "කර්මය" යන්නයි.
3. "චිත්ත" යන්නයි.
4. "සංඛාර" යන්නයි.

14. විදර්ශනා භාවනාවේ දී ප්‍රධාන වන්නේ,

1. මෛත්‍රියයි.
2. බුදු ගුණයි.
3. ත්‍රිලක්ෂණයයි.
4. සක්මනයි.

15. තමන් විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථවල කරුණු ඕනෑම අයුරකින් පිටපත් කරගත්තාට හෝ භාවිත කළාට හෝ වෙනත් අයකුගේ ලෙස නමක් යොදාගත්තාට හෝ කිසිදු වරදක් නැතැයි ප්‍රකාශ කරනු ලැබුවේ,

1. රේරුකානේ චන්ද විමල මාහිමිපාණන් වහන්සේ විසිනි.
2. අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්විසිනි.
3. අසරණසරණසරණංකර සංඝරාජමාහිමිපාණන්වහන්සේවිසිනි.
4. මිගෙට්ටුවත්තේ ගුණානන්දමාහිමිපාණන්වහන්සේවිසිනි.

16. බෞද්ධයාගේ අත්පොත ලෙස ගෞරවයට පාත්‍රව ඇත්තේ ,

1. ජාතක පොත් වහන්සේයි.
2. ධම්මපද ග්‍රන්ථයයි.
3. ලෝවැඩ සඟරාවයි.
4. සිරිත් මල්දමයි.

17. රහතන් වහන්සේගේ හැසිරීමට අනුව පුහුණු වීම සඳහා අප විසින් සමාදන් වී ආරක්ෂා කළයුතු වන්නේ ,

1. නිත්‍ය සීලයයි.
2. ආජීවඅෂ්ටමක සීලයයි.
3. උපෝෂථ අෂ්ටාංග සීලයයි.
4. ගේහසිත සීලයයි.

18. සීලය උපකාර කරගෙන යහපත් මිනිසුන් විසින් සංවර කරගනු ලබන්නේ ,

1. සිත, කයහාවචනයයි.
2. සිත හාකයයි.
3. සිත හා වචනයයි.
4. කය හා වචනයයි.

19. “උට්ඨානසම්පදා“ යන දහම් කරුණ මගින් ගිහියන්ට දී ඇති උපදේශය වන්නේ,

1. උත්සාහයෙන් ඉගෙන ගත යුතුය යන්නයි.
2. උත්සාහයෙන් භාවනා කළයුතුය යන්නයි.
3. උත්සාහයෙන් සිල් රැකිය යුතුය යන්නයි.
4. උත්සාහයෙන් ධනය රැස් කළයුතුය යන්නයි.

20. යමකු කල්‍යාණ මිත්‍රයන්මඇසුරුකරන්නේනම්ඔහුගේ,

1. ධනය හානිවීම වැළකේ.
2. අධ්‍යාපන දියුණුව වැළකේ.
3. නුවණ වැඩිවීම වැළකේ.
4. කීර්තිය පැතිරීම වැළකේ.

21. සමජීවිකතාව යනු,

1. අයවැය සමව පවත්වා ගැනීමයි.
2. අයට වඩා වැය අඩු කිරීමයි.
3. ධනය තැන්පත්කර තැබීමයි.
4. සරල ජීවිතයක් ගත කිරීමයි.

22. “කවුඩකු මෙන් ගසා කෑමෙහි සූරවූ, එබඳු හැකියාවක් ඇති, පවෙහි ලැජ්ජා නැති, අනුන්ගේ ගුණ මකන, ගෙන්ගෙට දුවන, කිළිටි දිවිපැවතුම් ඇති තැනැත්තාට ජීවත්වීම ඉතා ලෙහෙසිය.” මෙම අදහස ඇති ධම්මපද ගාථාවවන්නේ,

1. සුකරානි අසාධූනි ........ යන්නයි
2. නතං කම්මං කතං සාධූ ......... යන්නයි.
3. තංච කම්මං කතං සාධූ...... යන්නයි.
4. සුජීවං අහිරිකේන....... යන්නයි.

23.බුදුරජාණන 'වහන්සේ මෙලොව හා පරලොව හිතසුව පිණිස පවතින කරුණු හතර බැගින් කරුණු අටක් දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කොට වදාළේ,

1. මහා මංගල සූත්‍රයෙනි.
2. පරාභව සූත්‍රයෙනි.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙනි.
4. කරණීයමෙත්ත සූත්‍රයෙනි.

24. යමක් යහපත් ද අයහපත් ද කියා පිළිගැනීමේ දී භාවිතයට සුදුසු නිර්ණායක හතරක් බුදුරජාණන් වහන්සේ කාලාමයන්ට දේශනා කළ සේක. ඉන් එකක් වන්නේ ,

1.“තාර්කික ද, අතාර්කික ද කියාබලන්න”යන්නයි.
2. “න්‍යායානුකූල ද නැති ද කියාබලන්න”යන්නයි.
3. “පාරම්පරික ද නැති ද කියා බලන්න” යන්නයි.
4. “කුසල් ද අකුසල් ද කියා බලන්න” යන්නයි.

25. සැප දුක දෙකෙහි දී ම තමා හා අනුන් සමාන ලෙස සලකා ක්‍රියා කිරීම,

1. මෙත්තාවයි. 2. සමානාත්මතාවයි. 3. කරුණාවයි. 4. උපේක්ෂාවයි.

26. ලෝකයේ දක්නට ලැබුණ පුද්ගල විෂමතා 14 ක් පිළිබඳව විමසූ විට බුදුරජාණන් වහන්සේ චූල්ලකම්ම විභංග සූත්‍රය දේශනාකොට වදාළේ,

1. තෝදෙය්‍ය පුත්‍ර සුභ තරුණයාටයි. 2. සාරි බැමිණි පුත්‍ර උපතිස්ස තරුණයාටයි.
3. සුදොවුන් පුත්‍ර නන්ද තරුණයාටයි. 4. බිම්සර පුත්‍ර අජාසත් තරුණයාටයි.

27. නිතර ද්වේෂයෙන් හෙවත් තරහෙන් කටයුතු කරන අය ,

1. අඩුවයසින් මිය යති. 2. අල්පේශාක්‍යව උපදිති.
3. විරූපීව උපදිති. 4. පහත් කුලවල උපදිති.

28. යමෙකුට ධර්මය නුවණැසින් දැකීමට නම් ,

1. දෙව්ලොව නුවණැසින් දැකියයුතුය. 2. දිනපතා පන්සිල් ගත යුතුය.
3. හේතුඵල දහම නුවණින් දැකියයුතුය. 4. උදේසවස දහම් ගාථා කියයුතුය.

29. අනුලෝම පටිච්ච සමුප්පාදය අනුව අවිද්‍යාව හේතු කොට ගෙන,

1. ප්‍රතිසන්ධි සිත ඇතිවේ. 2. කුසල් අකුසල් රැස්කිරීමඇතිවේ.
3. නාම රූප ධර්ම ඇති වේ. 4. සිතින් දැඩිව ඇල්ලීම ඇති වේ.

30. චක්කවත්තී සීහනාද සූත්‍රයේ පටිච්ච සමුප්පාද විස්තරයට අනුව සමාජයේ සොරකම් වැඩිවන්නේ,

1. අවි ආයුධ බහුල නිසා ය. 2. දිළිඳුකම වැඩි වීම නිසා ය.
3. ප්‍රාණඝාතය නිසා ය. 4. විසම ලෝභය නිසා ය.

31. බුදු දහමේ ඉතාම වැදගත් මූලික ඉගැන්වීමක් වන්නේ,

1. සතර ආර්ය සත්‍යයි. 2. සතර සංග්‍රහ වස්තුවයි.
3. සතර සංවර සීලයයි. 4. සතර ඍද්ධි පාදයි.

32. බුදු රජාණන් වහන්සේ ජල දූෂණය වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. පෙරහන් කඩක් සෑම භික්ෂුවකටම නිර්දේශ කිරීමයි.
2. මළමුත්‍ර, කෙළ, වමනය ජලයට දැමීම තහනම් කිරීමයි.
3. ජලාශ ආශ්‍රිතව වෙහෙර විහාර තැනවීමයි.
4. ජලය හරහා යාත්‍රා කිරීම තහනම් කිරීමයි.

33. බුදු දහම පෙන්වා දෙන පරිදි අපට ලැබිය හැකි පරම උත්තම ලාභය වන්නේ,

1. නීරෝගීකමයි. 2. සතුටයි. 3. ධනයයි. 4. උගත්කමයි.

34. ලක්දිව පැවති, සිව්වන ථේරවාද ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූයේ,

1. ධර්මාශෝක රජතුමා ය.
2. වළගම්බා රජතුමා ය.
3. ප්‍රාදේශීය නායකයෙක් ය.
4. දේවානම් පියතිස්ස රජතුමා ය.

35. භාවනාව යනු,

1. ඕනෑම තනි අරමුණක සිත තබන මානසික අභ්‍යාසයයි.
2. කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසයයි.
3. කය වචනය සංවර කරන මානසික අභ්‍යාසයයි.
4. ශරීර ඉරියව් ක්‍රමවත් කරන මානසික අභ්‍යාසයයි.

36. දේවානම්පියතිස්ස රජු ඉදි කළ මහා විහාරය අංග සම්පූර්ණ බෞද්ධ මධ්‍යස්ථානයක් බවට සංවර්ධනය කරන ලද්දේ,

1. මහසෙන් රජතුමා විසිනි.
2. වසභ රජතුමා විසිනි.
3. වළගම්බා රජතුමා විසිනි.
4. දුටුගැමුණු රජතුමා විසිනි.

37. සිගාලෝවාද සූත්‍රය අනුව උතුරු දිසාවට උපමා කොට අප යුතුකම් ඉටු කළ යුත්තේ,

1. දෙමාපියන්ටයි.
2. ගුරුවරුන්ටයි
3. පැවිදි උතුමන්ටයි.
4. හිතමිතුරන්ටයි.

38. චතුරාර්ය සත්‍යයෙහි පළමු ආර්ය සත්‍යය වන දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳව බුද්ධ ශ්‍රාවකයින් කළ යුතු දෙය වන්නේ,

1. සම්පූර්ණයෙන් නැති කර දැමීම හෙවත් ප්‍රහානයයි.
2. ඉතා මැනැවින් අවබෝධ කිරීමයි.
3. සාක්ෂාත් කිරීම හෙවත් ප්‍රතිවේධයට පැමිණීමයි.
4. ප්‍රතිපදාව වැඩීම හෙවත් පුහුණු කිරීමයි.

39. රුවන්වැලි මහාසෑ රදුන්,

1. බුබ්බුලාකාර දාගැබ් වහන්සේ නමකි.
2. ධාන්‍යාකාර දාගැබ් වහන්සේ නමකි.
3. ඝණ්ඨාකාර දාගැබ් වහන්සේ නමකි.
4. ඝටාකාර දාගැබ් වහන්සේ නමකි.

40. දිවා රෑ පින් වඩවා ගැනීමට පාසල් සිසුන්ට පහසුවෙන් කළ හැකි පින් කටයුත්තක් වන්නේ,

1. වැඩිහිටි නිවසක් අරඹා නඩත්තු කිරීමයි.
2. මහා මාර්ග සාදා නඩත්තු කිරීමයි.
3. මල් පලතුරු ඔසු උයන් සාදා නඩත්තු කිරීමයි.
4. තමන් සතු සියල්ල අතහැර දන් දීමයි.

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
- 2018
**Second Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **02 සිට 07 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 ක් ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

---

01.
1. මහාභිනිෂ්ක්‍රමණයෙන් පසු අප මහා බෝසතාණන්ට හමුවූ ගුරුවරුන් දෙදෙනෙකු නම්කරන්න.
2. නිවන් අරමුණ ඇති ආර්ය ශ්‍රාවකයන් අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.
3. බුද්ධරත්නයේ ගුණ නවයෙන් පළමු ගුණ දෙක ලියන්න.
4. වචනයෙන් සිදු කරනු ලබන වැරදි දෙකක් ලියන්න.
5. තණ්හාවේ ප්‍රභේද තුනෙන් දෙකක් ලියන්න.
6. මහා මංගල සූත්‍රයේ දැක්වෙන පළමු හා දෙවන මංගල කරුණු මොනවාද?
7. භද්දාලිය සූත්‍රය අනුව පමණ දැන ආහාර අනුභවයෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න.
8. විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද දෙකක් ලියන්න.
9. ශ්‍රද්ධාවෙහි ප්‍රභේද දෙක ලියා දක්වන්න.
10. බුදු දහමේ දැක්වෙන භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක ලියන්න.

(ලකුණු 2X 10 = 20)

02.
1. පාරමිතා සඳහා තවත් නමක් ලියන්න. (ලකුණු - 02)
2. පාරමිතා පිරීමේ දී අත්හළ යුතු කරුණු තුන කුමක් ද? (ලකුණු - 03)
3. දසපාරමිතා අතරින් ප්‍රඥා, වීර්ය හා අධිෂ්ඨාන යන පාරමිතා සිසු දිවියේ දියුණුවට යොදාගත හැකි ආකාරය විමසන්න. (ලකුණු 05 )

03.
1. නීවරණ යන වචනයේ තේරුම කුමක් ද? (ලකුණු 02)
2. පංච නීවරණ වලින් තුනක් නම් කරන්න. (ලකුණු 03)
3. පංච නීවරණ යටපත් කිරීමෙන් සිසුන්ට සිදුවන වාසි පැහැදිලි කරන්න. (ලකුණු 05 )

04.
1. නතං කම්මං කතං සාධු ........ යනා දී ධම්මපද ගාථාව ලියාදක්වන්න. (ලකුණු 02)
2. එහි සරල තේරුම ලියාදක්වන්න. ( ලකුණු 03)
3. පසුතැවීම හා නරක විපාක වලින් මිදී සිසු ජීවිතය සහනයටත් දියුණුවටත් පත්කර ගැනීම සඳහා පස් පවින් වැළකී යහපතෙහි යෙදීම හේතුවන බව පෙන්වා දෙන්න. (ලකුණු 05 )

05. 1. බුද්ධ කාලීන භාරතයේ පැවති ප්‍රධාන පාලන ක්‍රම 02 නම්කරන්න. (ලකුණු 02)

2. සප්ත අපරිහානීය ධර්මවලින් 03 ක් ලියන්න. (ලකුණු 03)

3. යහපත් සමාජයක් බිහිකර ගැනීම සඳහා සප්ත අපරිහානීය ධර්ම වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. 1. පස්වග හිමිවරුන් උතුම් වූ රහත් ඵලයට පැමිණියේ කුමන සූත්‍ර දේශනාව ශ්‍රවණය කිරීමෙන් ද? (ලකුණු 02)

2. ත්‍රිලක්ෂණය නම් කරන්න. ( ලකුණු 03)

3. ත්‍රි ලක්ෂණය පිළිබඳ අවබෝධය නිසා මිනිස් ජීවිතයේ දෙලොව දියුණුව සකස් වන ආකාර යසාකච්ඡා කරන්න. (ලකුණු 05 )

07. පහත ඒවායින් මාතෘකා දෙකක් පමණක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

1. පංචස්කන්ධය (ලකුණු 05 )
2. චෛතියසර හෙවත් වටදාගෙය (ලකුණු 05 )
3. ප්‍රථම සංගායනාව (ලකුණු 05 )
4. අනගාරික ධර්මපාල තුමා (ලකුණු 05 )